00141

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන 2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**SNU5540/ ESU3240 - තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.01.25 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>**01 - වන කොටස**</u>

01. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයෙහි නිරත ගුරුවරයෙකු සඳහා තුලනාත්මක අධ්‍යාපනය හැදෑරීමෙහි වාසි හතරක් (04) දක්වන්න.

02. ප්‍රාදේශීයකරණයෙහි සිට ගෝලීයකරණය කරා සංක්‍රමණය වීම සහ එයින් ගම්‍යවන දෑ විස්තර කරන්න.

03. 1972 විෂයමාලා ප්‍රතිසංස්කරණයන්හි වැදගත්කම අදාළ උදාහරණ දෙකක් (02) සපයමින් තක්සේරුකරණය කරන්න.

04. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය හා සම්බන්ධ අධ්‍යාපන අභියෝග හතරක් (04) හඳුනාගන්න.

05. 1867 මෝර්ගන් කමිටුව මගින් ඉදිරිපත් කළ යෝජනා පහක් (05) ලැයිස්තුගත කරන්න.

06. එක්සත් රාජධානියෙහි අධ්‍යාපන පද්ධතිය ශ්‍රී ලංකාවේ නවීන අධ්‍යාපන පද්ධතිය කෙරෙහි බලපා ඇත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.

07. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ලංදේසි අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ හතරක් (04) දක්වන්න.

(ලකුණු 08x05=40)



53

## 02 - වන කොටස

09. (i.) 1943 විශේෂ අධ්‍යාපනය කමිටුවක් පත් කිරීමට හේතු වූ ඓතිහාසික සහ සමාජ දේශපාලන තත්ත්වයන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) 1943 විශේෂ අධ්‍යාපන කමිටු යෝජනා පහක් **(05)** හඳුනාගෙන ඉන් එකක් (01) සඳහා විස්තරාත්මක පැහැදිලි කිරීමක් සපයන්න. (ලකුණු 08)

(iii.) ඉහත (ii.) හි සඳහන් කළ යෝජනා ශ්‍රී ලාංකික සමාජයට බලපෑ ආකාරය ගැළපෙන උදාහරණ සමග විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

10. (i.) ශ්‍රී ලංකාවේ ස්වදේශීය අධ්‍යාපන පද්ධතියෙහි ලක්ෂණ හතරක් **(04)** හඳුනාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) පැරණි ශ්‍රී ලාංකික අධ්‍යාපනයෙහි යොදාගත් විෂය මාලාව ඉගැන්වීමේ ක්‍රම සහ ඉගෙනුම් සම්පත් ඒවායේ සුවිශේෂී ලක්ෂණ දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 09)

(iii.) විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ගුරුවරයෙකු ලෙස ඔබේ දෘෂ්ටිකෝණයට අනුව ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන පද්ධතියෙහි ප්‍රබලතා සහ දුබලතා අගයන්න. ඔබගේ විශ්ලේෂණය සනාථ කිරීමට සුදුසු උදාහරණ සපයන්න.

(ලකුණු 07)

11. **"විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයට තාක්ෂණය සමෝධානය කිරීම නව ප්‍රවණතාවකි"**

(i.) ශ්‍රී ලාංකික සන්දර්භය තුළ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයට තාක්ෂණය සමෝධානය කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) සැබෑ පන්ති කාමරයේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයට තාක්ෂණය සමෝධාන කිරීමේදී ඔබට මුහුණ දීමට සිදුවන අභියෝග දෙකක් **(02)** සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(iii.) ඔබ ඉහත (ii.) හි සඳහන් කළ අභියෝග මැඩ පවත්වා ගැනීමට ප්‍රායෝගික උපායමාර්ග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i.) "බහු වාර්ගික සමාජයක්" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) දකුණු අප්‍රිකාවේ ප්‍රතිපත්ති පිළිබඳ තීරණ සලකා බලා වර්ණභේද ප්‍රතිපත්තියෙහි ප්‍රධාන ලක්ෂණ පහක් හඳුනා ගන්න. (ලකුණු 06)

(iii.) දකුණු අප්‍රිකාවේ අධ්‍යාපන ක්‍රියාමාර්ග කෙරෙහි වර්ණභේද ප්‍රතිපත්තිය බලපෑ ආකාරය සහ අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට රජය මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ග විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

13. (i.) "ජාතික මට්ටමෙහි භාෂා ප්‍රතිපත්තියක්" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) රටකට භාෂා ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීමේ වැදගත්කම අදාළ උදාහරණ දෙකක් **(02)** සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii.) කේවල සුළු ජාතික කණ්ඩායම්වල සහ මුළු ජාතියේම අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකාව මගින් උපයෝගී කර ගන්නා ජාතික භාෂා ප්‍රතිපත්තියෙහි ප්‍රමාණාත්මතාවය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 10)

14. (i.) මෙයිජි පාලන සමයේ ජපානයේ හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) ජපානයේ ද්විතියික අධ්‍යාපනය සම්බන්ධව විවාදයට භාජනය වූ කරුණු දෙකක් **(02)** හඳුනාගෙන ඒවා සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) ඉහත (ii.) හි සඳහන් ගැටලු විසඳීම සඳහා ජපානය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් **(03)** විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

\- සියලුම හිමිකම් ඇවිරිණි. -



55